## 217 මගේ පාද පමණක් නොව

මගේ පාද පමණක් නොව
සෝදනු මා හිස දැනද
එදා ඔබේ අග සව්වන් පැවසුවේ එසේ
සමිඳෙ අපද සෝදනු මැන
ඔබේ සිතැගි සේ //

ඔබේ සිසුන්ගේ දෙපා දොවින්නට
බැගෑ සිතින් ඔබ පහත් වුණේ
එපා එපා යයි පිළිකෙව් කෙරුණත්
සමිඳුනි ඔබ නැ ඉඩ දුන්නේ //

නො සේදුවොත් මා අතින් ඔබේ පා
නොවේ කිසිදු හවුලක් මා හා
නොතේරුණත් දැන් මා කරනා දේ
පසුවයි ඔබ වටහා ගන්නේ //

මහා මහිමෙ කිතු සමිඳරුවන්ගේ
පෙනෙන්නෙ එතුමන් දාස බවේ
බොහෝ දෙනෙකු අද නැ පැහැදෙන්නේ
පහත්වීම දැක සමිඳුන්ගේ //

අපේ සමිඳු ගුරු දෙවියන් කළ සේ
බැගෑ බවමැ පිළිගත යුතු වේ
එසේ කළොත් ඉඳුරා හැකිවනුයේ
යන්නට එතුමන් අනුගමනේ //

තමන් තමන්ව මැ පහත් කරන්නෝ
උසස් තැනෙහි නංවනු ලබති
උඩගුකමින් මානයෙන් දැපෙන්නෝ
පහත් බවේ පතුලට හෙළෙති //